# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 1 දරන

# පිහියා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ : ශත 35 යි  තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 1 දරන පිහියා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 113/78.

**පිහියා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1983 අංක 1 දරන පිහියා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**27 වන අධිකාරයේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන පිහියා ආඥාපනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"තහනම් පිහියා පාවිච්චි කිරීම ආදිය සම්බන්ධයෙන් දණ්ඩනය.

3. යම් තහනම් පිහියක් තමා වෙත හෝ තමා ළඟ තබා ගන්නා වූ හෝ පාවිච්චි කරන්නා වූ යම් තැනැත්තකු වරදක් කරන අතර, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු අතර, රුපියල් පණහක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් විය යුතු ය. තව ද දෙවන හා යම් තදනන්තර වරදක් සඳහා මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හා රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් විය යුතු ය; තව ද මේ වගන්තිය යටතේ වූ සෑම නඩු පැවරීමක දී ම ඒ තැනැත්තා වරදකරු කරනු ලැබුවේ යම් තහනම් පිහියක් සම්බන්ධයෙන් ද ඒ තහනම් පිහිය රාජසන්තක කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වැරදි විභාග කළ යුතු අධිකරණය.

7. මේ ආඥාපනතේ විධිවිධානවලට පටහැනිව සිදු කරන ලදැයි කියනු ලබන සෑම වරදක් ම, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මේ ආඥාපනත යටතේ වරදකරුවන් අවවාද කිරීමෙන් හෝ කොන්දේසි සහිතව හෝ නිදහස් නොකළ යුතු බව.

8. මේ ආඥාපනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබූ තැනැත්තකු කෙරෙහි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තියේ සිට 309 වන වගන්තිය තෙක් වූ (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“ නඩු පැවරීම සීමා කිරීම.

10. වරද සිදු කරන ලදැයි කියනු ලබන අවස්ථාවේ සිට මාස තුනක් ඉකුත් වූ පසු මේ ආඥා පනතට පටහැනිව සිදුකරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව, කිසිම නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.”.